රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුවේ නම	ශීර්ෂය
01. අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	- 110
02. අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව	- 228
03. නීතිපති දෙපාර්තමේන්තුව	- 229
04. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව	- 230
05. බන්ධනාගාර දෙපාර්තමේන්තුව	- 232
06. රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	- 233
07. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	- 234
08. නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	- 235
09. මහා භාරකාර දෙපාර්තමේන්තුව	- 205
10. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	- 326
11. ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව	- 231

ආයතනයේ නම හා	**2017** ගිණුම් වර්ෂයේ හඳුනාගත් දුර්වලතා	එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග සහ

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.

ශීර්ෂය		**වර්තමාන තත්වය**
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය - 110	1. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2017.12.31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය, යාවත්කාලීන කර නොතිබූ අතර මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනයේ දත්ත ඇතුළත් කරමින් පවතී. ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	2. හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන නැත.	2017.12.31 දිනට හානි පිළිබඳ ලේඛනය, යාවත්කාලීන කර නොතිබූ අතර මේ වන විට හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කරමින් පවතී. එමෙන්ම ඉදිරියේදී හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	3. විගණකාධිපති වරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත
	4. විගණන කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	2017 වර්ෂයේ ජුනි මස දක්වා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම නිසා විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට නොහැකි වූ අතර 2018 වර්ෂයේදී විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 03ක් පවත්වා ඇත. 2019 වර්ෂයේ සිට නියමිත පරිදි කාර්තුවකට වරක් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.
	5. සමාලෝචිත වර්ෂය සඳහා නියමිත දිනයට භාණ්ඩ	2017 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය සිදු කර 2018.06.04 වන විට

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	අදාල නිර්දේශ ක්‍රියාත්මක කර අවසන් කර ඇත. එමෙන්ම මේ වන විට 2018 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණය සිදු කර ඊට අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දී ඇති අතර අබිලි භාණ්ඩ වෙන්දේසිය සිදු කළ යුතුව පවතී.කෙසේ වුවද ඉදිරියේදී නියමිත කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර අවසන් කිරීමට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.
	6. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුනි.	ඉදිරියේ දී නියමිත පරිදි සංචිත වාහන සඳහා වන දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට වාහන වල ලොග් පොත් යාවත්කාලීන කර ඇත.
	7. බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	2017 වර්ෂයට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශයේ ගැලපුම් කළ යුතුව පැවති ශේෂ 2018.02.28 දින වන විට නිරවුල් කර ඇති අතර මේ වන විට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ජනිත වන ගැලපුම් කළ යුතු ශේෂ සම්බන්ධයෙන් අදාල මාසය තුළම නිවැරදි කිරීමට කටයුතු කරනු ලබයි.
	8. අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකරගෙන තිබුණි.	භාණ්ඩාගාරයෙන් නියමිත පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් පෙර වර්ෂයේ ගෙවීමට නොහැකි වූ බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගෙවීම් කිරීමට සිදු විය. එහෙයින් ප්‍රවර්ථන වර්ෂයේ ඇස්තමේන්තු ගත වියදම් වලට අදාල වවුචර් බැඳීම් ලෙස දැක්වීමට සිදු වී ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	9. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2017.12.31 දිනට වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ රු. 829,644.33ක ණය ශේෂ අතුරින් රු.107,606.33 ක මුදලක් අය කර ගෙන ඇති අතර රු. 10,250.00ක මුදලක් කපාහැර ඇත. එමෙන්ම අය කර ගත නොහැකි ණය මුදල් කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත. තවද අය විය යුතු ඉතිරි ණය ශේෂ අයකර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතී.
	10. අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	2017.12.31 දිනට අනුමත සීමාව ඉක්මවා සිටි අතිරික්ත කාර්ය මණ්ඩලය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක "DMS/0002(T)" දරණ 2018.09.27 දිනැති ලිපිය මඟින් 2018 වර්ෂයේදී අනුමත කර ඇත.
අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව - 228	1. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	2017.12.31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබූ අතර මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනය හා පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණයට දත්ත ඇතුළත් කරමින් පවතී. තවද ඉදිරියේදී මෙම ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	2. විගණකාධිපති වරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	3. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මේ වන විට ලැබී තිබූ අභ්‍යන්තර විගණන විමසුම් සියල්ල සඳහා පිළිතුරු ලබා දී ඇති අතර අභ්‍යන්තර විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමට නිලධාරීන් දැනුවත් කර ඇත.
	4. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	2017 වර්ෂයේ ජුනි මස දක්වා අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතීම නිසා විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට නොහැකි වූ අතර 2018 වර්ෂයේදී විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 03ක් පවත්වා ඇත. 2019 වර්ෂයේ සිට නියමිත පරිදි කාර්තුවකට වරක් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.
	5. සමාලෝචිත වර්ෂය සඳහා නියමිත දිනයට භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2017 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය සිදු කර 2018.12.28 වන විට අදාල නිර්දේශ ක්‍රියාත්මක කර අවසන් කර ඇත. දිවයින පුරා පිහිටි අධිකරණයන්හි වෙන වෙනම භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කරන අතර නියමිත කාල රාමුව තුළ සමීක්ෂණ කටයුතු පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාදයන් සිදුවී ඇත. එමෙන්ම මේ වන විට 2018 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා සඳහා අනුමැතිය ලබා දී ඇති අතර අධිකරණ කිහිපයක පමණක් අබිලි භාණ්ඩ වෙන්දේසිය සිදු කළ යුතුව පවතී. කෙසේ වුවද ඉදිරියේදී නියමිත කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර අවසන් කිරීමට අදාල හැකි සෑම උත්සාහයක්ම ගන්නා ලෙස අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	6. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුනි.	ඉදිරියේ දී නියමිත පරිදි සංචිත වාහන සඳහා වන දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලෙස නිලධාරින් වෙත උපදෙස් ලබා දී ඇති අතර මේ වන විට වාහන වල ලොග් පොත් යාවත්කාලීන කර ඇත.
	7. බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කලයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	2017 වර්ෂයට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශයේ ගැලපුම් කළ යුතුව පැවති ශේෂ නිරවුල් කර ඇති අතර මේ වන විට බැංකු සැසඳුම් ප්‍රකාශය තුලින් ජනිත වන ගැලපුම් කළ යුතු ශේෂ සම්බන්ධයෙන් අදාල මාසය තුළම නිවැරදි කිරීමට කටයුතු කරනු ලබයි.
	8. අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇති කරගෙන තිබුණි.	භාණ්ඩාගාරයෙන් නියමිත පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් පෙර වර්ෂයේ ගෙවීමට නොහැකි වූ බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගෙවීම් කිරීමට සිදු විය. එහෙයින් ප්‍රවර්ථන වර්ෂයේ ඇස්තමේන්තු ගත වියදම් වලට අදාල වවුවර්, බැදීම් ලෙස දැක්වීමට සිදු වී ඇත.
	9. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2017.12.31 දිනට වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ රු. 14,657,549.61ක ණය ශේෂ අතුරින් රු.4,420,308.55 ක මුදලක් අය කර ගෙන ඇති අතර රු. 39,622.87ක මුදලක් කපාහැර ඇත. එමෙන්ම අය කර ගත නොහැකි ණය මුදල් කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත. තවද අය විය යුතු ඉතිරි ණය ශේෂ අයකර ගැනීම සඳහා ඉදිරි කටයුතු කරමින් පවතී.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	10. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු ලෙස පවතිනුයේ ඉදිකිරීම් වලට අදාල කොන්ත්‍රාත්කරුවන්ගේ රැඳවුම් මුදල් හා නඩු කටයුතු වලට අදාල ඇප තැන්පත් වේ. වසර 02ට වඩා අධික කාලයක් ක්‍රියාත්මක වන ඉදිකිරීම් වලට අදාල රැඳවුම් මුදල් අදාල ඉදිකිරීම අවසන් වන තෙක් රඳවා තබා ගතයුතු බැවින් එම තැන්පතු වසර 02 ඉක්මවුවද තැන්පත් ගිණුමේ රඳවා තබා ගතයුතුව ඇත. එමෙන්ම විදේශ සිතාසි වෙනුවෙන් වන තැන්පතු ශේෂ සඳහා අධිකරණ නියෝගයක් ලැබෙන තෙක් රඳවා තබා ගැනීමට සිදුවේ. මෙම කරුණු මත හැර නිදහස් කළ හැකි සියළු තැන්පතු ශේෂ නියමිත කාලය තුළ නිදහස් කිරීමට කටයුතු කර ඇත.
නීතිපති දෙපාර්තමේන්තුව - 229	1. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට සියළුම ස්ථාවර වත්කම් ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලබන අතර ස්ථාවර වත්කම් ලේඛණය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	2. මුදල් රෙගුලාසි 135 පරිදි ආයතනය තුල මූල්‍ය බලතල පැවරීමක් සිදුකර නොතිබුණි. මූල්‍ය බලතල පැවරීම ප්‍රමාණවත් පරිදි ආයතනය තුල සන්නිවේදනය කර නොතිබුණි.	2017 වර්ෂයට අදාලව මුදල් රෙගුලාසි 135ට අනුව මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොමැති අතර 2016 වර්ෂයේ මුදල් රෙගුලාසි 135 මූල්‍ය බලතල පැවරීම පදනම් කර ගනිමින් ගෙවීම් කටයුතු සිදු කර ඇත. එහෙත් 2018 හා 2019 වර්ෂයන්ට අදාලව මු.රෙ.135 ප්‍රකාරව මූල්‍ය බලතල පැවරීම සිදු කර ආයතනය තුල සන්නිවේදනය කර ඇත.
	3. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට පෙර සකස් කර

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

		ඉදිරිපත් කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	4. විගණකාධිපති වරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	2017 වර්ෂයට අදාලව විගණන විමසුම් 02 ක් සඳහා පිළිතුරු ලබා දීම ප්‍රමාද වූ අතර 2018.01.12 වන විට 2017 වර්ෂයට අදාල සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත. කෙසේ වුවද ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	5. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව මඟින් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නොපවත්වන අතර අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ විගණන හා කළමණාකරණ රැස්වීම් වලට සහභාගි වී ඇත.මේ වන විට මෙම දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඇති බැවින් ඉදිරියේදී විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමින් පවතී.
	6. සමාලෝචිත වර්ෂය සඳහා නියමිත දිනයට භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2017 වර්ෂයට අදාලව දෙපාර්තමේන්තුව තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කල අතර මහාධිකරණ වෙත අනුයුක්ත කර ඇති රජයේ අධිනීතිඥවරුන්ගේ නිල මැදිරි වල වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වීම මත භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළියෙළ කිරීමට නොහැකි විය. 2018 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර මේ වන විට මහාධිකරණ වෙත අනුයුක්ත කර ඇති රජයේ අධිනීතිඥවරුන්ගේ නිල මැදිරි වල වල අපහරණ කටයුතු සිදු කරමින් පවතී.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	7. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2017 වර්ෂයේ වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට තිබූ ණය ශේෂය රු.251,560.00 ක් වන අතර එම මුදලින් රු. 115,040.00 ක ණය මුදලක් 2018 දෙසැම්බර් මස සිට වාරික ලෙස අය කරමින් පවතී. සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂය වූ රු.1,325,757.00 ක ණය මුදලින් රු.743,315.00 ක ණය මුදලක් අය කර ගැනීම සඳහා 2018 වර්ෂයේ නඩු පැවරීමට කටයුතු කර ඇත. රු.10,000.00 ක අඩු ණය ශේෂයන් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතී.
	8. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2017 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව 2019 මාර්තු මාසයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව - 230	1. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව මඟින් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නොපවත්වන අතර අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ සියළු විගණන හා කළමණාකරණ රැස්වීම් වලට සහභාගි වී ඇත.
	2. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුනි.	2019 වසරේ සිට සංචිත වාහන වල ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර වාහන වල ලොග් පොත් යාවත්කාලීන කර ඇත.
	3. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර	2017 හා 2018 වර්ෂ වල නියමිත දිනට කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි වුවද 2019 වසරේ සිට නියමිත කාල වකවානුව තුළදී

	නොතිබුණි.	කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
බන්ධනාගාර දෙපාර්තමේන්තුව - 232	1. පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	2017.12.31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයට අවශ්‍ය තොරතුරු දිවයින පුරා පිහිටි අනෙකුත් බන්ධනාගාර ආයතන වෙතින් ගෙන්වා ගැනීමට ප්‍රමාද වීම හේතුවෙන් යාවත්කාලීන කර අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමින් පවතී.
	2. විගණකාධිපති වරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට මූලස්ථානයේ අංශ හා බන්ධනාගාර ආයතන 29ක් වෙතින් පිළිතුරු කැඳවා පසුව පිළිතුරු සකස් කරනු ලබයි. එහිදී අංශ හා බන්ධනාගාර ආයතන වෙතින් ලබා දෙන පිළිතුරු ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී නැවත නැවතත් විමසීම් කර අවසාන පිළිතුරක් සකස් කළ යුතු බැවින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේ ප්‍රමාදයන් සිදු වී ඇත.කෙසේ වුවද ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	3. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2017 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ නිර්දේශ 2018.12.31 දින වන විට ක්‍රියාත්මක කර අවසන් කර ඇති අතර ඉදිරියේදී නියමිත කාල වකවානුව තුල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

	4. අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකරගෙන තිබුණි.	භාණ්ඩාගාරයෙන් නියමිත පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් පෙර වර්ෂයේ ගෙවීමට නොහැකි වූ බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගෙවීම් කිරීමට සිදු විය. එහෙයින් ප්‍රවර්ථන වර්ෂයේ ඇස්තමේන්තු ගත වියදම් වලට අදාල වවුචර් බැඳීම් ලෙස දැක්වීමට සිදු වී ඇත.
	5. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2017.12.31 දිනට වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ ණය ශේෂ අය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස දිවයින පුරා පිහිටි බන්ධනාගාර ආයතන දැනුවත් කර ඇත.
	6. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු ලෙස පවතින වසර 02ට වඩා අධික කාලයක් ක්‍රියාත්මක වන ඉදිකිරීම් වලට අදාල කොන්ත්‍රාත්කරුවන්ගේ රැඳවුම් මුදල් වන අතර අදාල ඉදිකිරීම අවසන් වන තෙක් රඳවා තබා ගැනීම නිසා වසර 02 තුළ නිදහස් කිරීමට නොහැකි වී ඇත.එමෙන්ම නිලධාරීන්ගේ වැටුපෙන් අය කර තැන්පත් කර ඇති ඇප වෙනුවෙන් වූ මුදල් තැන්පතු බැංකු ගිණුම් ආරම්භ කර කඩිනමින් බැංකු ගත කිරීමටත් පවත්නා ටෙන්ඩර් තැන්පතු කඩිනමින් අදාල ටෙන්ඩර්කරුවන් වෙත මුදා හැරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි.
	7. සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ පැවති ශේෂය අදාල චක්‍රලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාර	2017.12.31 දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පියවීම සඳහා මුදල් පොතේ ශේෂයක් නොතිබූ අතර 2018.01.01 දින

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	ශේෂය අදාල වක්‍රලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය කර නොතිබුණි.	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඒ බව දන්වා ඇත. නමුත් 2017 වර්ෂයේ උප අග්‍රිම ලෙස නිකුත් කර තිබූ රු.178,499.96 ක නොපියවූ අග්‍රිම ශේෂය මුදලින් ගෙවා ඇති අතර ඊට අදාල වටිනාකම 2018.05.21 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පියවා ඇත.
රස පරීක්ෂක දෙපාර්තමේන්තුව - 233	1. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. භානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	ස්ථාවර වත්කම් ලේඛණය හා භානි පිළිබඳ ලේඛණය යාවත්කාලීන කර ඇත.
	2. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයක් නොමැති අතර එම තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කරන බව MpubAd/AssD/11 අංක දරණ 2017/01/26 දිනැති ලිපියෙන් රාජ්‍ය පරිපාලන කළමණාකරණ අමාත්‍යාංශය විසින් දැනුම්දී ඇතත් මේ වන තෙක් නිලධාරියෙකු අනුයුක්ත කර නොමැත. එබැවින් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වලට සහභාගිවේ.
	3. සමාලෝචිත වර්ෂය සඳහා නියමිත දිනයට භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද	2017 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාල වාර්තා 2018/03/13 දික විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර 2018/12/07 දින භාණ්ඩ වෙන්දේසිය සිදු කර සියළු නිර්දේශ ක්‍රියාතමක කර අවසන් කර ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	
	4. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. <u>සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුනි.</u>	දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කිරීම අවසන් කර ඇති අතර මෙම මස ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන අතර වාහන වල ලොග් පොත් යාවත්කාලීන කර ඇත.
	5. බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කලයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කලයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු සිදු කර මේ වන විට සියල්ල නිරවුල් කර නිවැරදි කර ඇත.
	6. අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකරගෙන තිබුණි.	මු.රෙ. 94(11) ප්‍රතිපාදනයන්ට අනුව පුනරාවර්තන ස්වභාවයේ වියදම් වෙනුවෙන් පසුගිය වර්ෂ 03ක සාමාන්‍යයන් 50%ක් දක්වා බැරකම් වලට ඵලඹීමේ හැකියාවක් ඇත. කෙසේ වුවද භාණ්ඩාගාරයෙන් නියමිත පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් පෙර වර්ෂයේ ගෙවීමට නොහැකි වූ බිල්පත් සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ගෙවීම් කිරීමට සිදු විය. එහෙයින් ප්‍රවර්ථන වර්ෂයේ ඇස්තමේන්තු ගත වියදම් වලට අදාල වවුචර් බැදීම් ලෙස දැක්වීමට සිදු වී ඇත.
	7. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වැඩ තහනමට ලක්ව සිටින ඩබ්.එස්.කේ. පෙරේරා මියට අදාල වන අතර මෙම නිලධාරිනියට එරෙහිව ක්‍රියාත්මක වන නඩු කටයුත්ත නිම වන තෙක් අය කර ගැනීමට හෝ කපා හැරීම සම්බන්ධ තීරණයක්

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

		ගැනීමට නොහැකි වී ඇත.
	8. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2017 වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2019.06.09 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව - 234	1. පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛණය 2017 වර්ෂයේ යාවත්කාලීන කර නොතිබුණ ද පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව සියළු විස්තර ද සහිතව ඉන්වෙන්ට්‍රි ලේඛණයක් පවත්වාගෙන ගොස් ඇත. 2018 වර්ෂයේ සිට පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නිසි පරිදි පවත්වා ගෙන යනු බලයි.
	2. විගණකාධිපති වරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	2017.07.20 සහ 2017.07.11 දිනැති විගණන විමසුම් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණේ පිළිවෙලින් 2017.07.28 හා 2017.08.02දී වන අතර ඒ සඳහා පිළිතුරු පිළිවෙලින් 2017.07.31 හා 2017.08.02 දින ලබාදී ඇත.
	3. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන අතර එම සියළු විගණන හා කළමණාකරණ රැස්වීම් වලට සහභාගි වී ඇත.
	4. සමාලෝචිත වර්ෂය සඳහා නියමිත දිනයට භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන්	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු කර ඇති අතර එම වාර්තා 2018.03.27 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත සහ

	අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	ඌණතා පිළිබඳ වන නිර්දේශ ද අනිකුත් නිර්දේශ ද 2018 වර්ෂය තුල ක්‍රියාත්මක කර 2018.08.06 දින විගණකාධිපති වෙත වාර්තා කර ඇත.
	5. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුනි.	ඉදිරියේ දී සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ද වාහන වල ලොග් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලෙස ද අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි.
	6. බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කලයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල හැකි සියළු ශේෂ සම්බන්ධව ගැලපුම් කර ඇත.එහෙත් බැංකු ගත නොවූ තැන්පතු ලෙස පවතින රු.48,978.00 ක මුදලට අදාලව විනය පරීක්ෂණයක් පැවැත්වෙන අතර එහි නිර්දේශ ලැබෙන තෙක් අදාල ගැලපුම් කිරීමට නොහැකි වී ඇත.
	7. අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකරගෙන තිබුණි.	2017 වර්ෂයේදී අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකර ගෙන තිබූ අතර 2019 වර්ෂය වන විට මෙම තත්ත්වය නිවැරදි කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	8. අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි. .	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීම් සිදු නොකරන අතර අධිකරණ අමාත්‍යාංශය හා අධිකරණසේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම සිදු කරනු ලබයි. 2017 වර්ෂයේදී අනුමත සීමාව ඉක්මවා සිටි කාර්ය මණ්ඩලය 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත.නමුත් අදාල ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොවීම නිසා

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

		මේ වන විටත් රෙජිස්ට්‍රාර් 11 ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකුගේ අතිරික්තයක් පවතී.
	9. කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	2018 වර්ෂයේ සිට කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් ලබාදී ඇත.
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව - 235	1. ලැබෙන චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ලැබෙන චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කොට ඇත.
	2. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබූ සියළු විගණන හා කළමණාකරණ රැස්වීම් වලට සහභාගි වී ඇත.
	3. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.
	4. අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකරගෙන තිබුණි.	ඉදිරියේදී අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇති කර නොගැනීමට කටයුතු කරනු ලැබේ.
	5. හිඟ හිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	හිඟ හිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් සකස් කිරීමට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නොපැවතුණි.
මහා භාරකාර දෙපාර්තමේන්තුව - 205	1. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කල යුතු සියළුම තොරතුරු මේ වන විට එක් රැස් කරගෙන ඇති අතර එම තොරතුරු පදනම් කරගෙන එම ලේඛණය සඳහා තොරතුරු ඇතුලත් කිරීම ආරම්භ කර ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	2. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	2018.12.31 දින වන විට 2017 වර්ෂයට අදාලව පැවති සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇති අතර මසක් තුල අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
	3. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	2018 වර්ෂයේදී පහත පරිදි විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත. <u>කාර්තුව</u> — <u>රැස්වීම් පැවැත්වූ දිනය</u> 01 කාර්තුව — 2018.05.15 01 කාර්තුව — 2018.10.01 01 කාර්තුව — 2018.12.14
	4. සමාලෝචිත වර්ෂය සඳහා නියමිත දිනයට භාණ්ඩ සමීක්ෂණය සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2017 වර්ෂය තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනට පවත්වා නොමැති වුවද එම වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර 2018 ඔක්තෝම්බර් 08 දින විගණකාධිපති වෙත වාර්තා කර ඇත. එම භාණ්ඩ සමීක්ෂණයට අදාලව 2018.12.14 දින වන විට නිර්දේශ ක්‍රියාත්මක කර අවසන් කර ඇත. එමෙන්ම 2018 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2019.05.31 දින අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව - 326	1. විසර්ජන ගිණුම නියමිත දිනට ඉදිරිපත් කර නැත.	2017 වර්ෂයට අදාලව විසර්ජන ගිණුම නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර එය 2018.04.05 දින ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.තවද 2018 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

		ඉදිරිපත් කර ඇත.
	2. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම නියමිත දිනට ඉදිරිපත් කර නැත.	2017 වර්ෂයට අදාලව අත්තිකාරම් බී ගිණුම නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර එය 2018.07.25 දින ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.තවද 2018 වර්ෂයට අදාලව අත්තිකාරම් බී ගිණුම නියමිත දිනට පෙර ඉදිරිපත් කර ඇත.
	3. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. බඩු වට්ටෝරු ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත. හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	2017.12.31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය, බඩු වට්ටෝරු ලේඛණය හා හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීන කර අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර මේ වන විට එම සියළු ලේඛන යාවත්කාලීන කර ඇත. තවද ඉදිරියේදී මෙම ලේඛණ යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
	4. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන අතර එම රැස්වීම් වලට සහභාගි වී ඇත.
	5. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉදිරියේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත හා ඌණතා පිළිබඳව වන නිර්දේශ නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.
	6. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුනි.	සංචිත වාහන සඳහා 2017 හා 2018 වර්ෂයන්ට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා මේ වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර වාහන සඳහා වන ලොග් පොත් මේ වන විට යාවත්කාලීන කර ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	7. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවති හිඟ ණය ශේෂ අතුරින් එක් නිලධාරියක්ගේ ණය ශේෂය වාරික ලෙස මේ වන විට ඇපකරුගෙන් අය කර ගනු ලබන අතර එම නිලධාරියාට අදාලව තවදුරටත් අය වීමට ඇති ශේෂය රු.24,646 ක් වේ. තවද වැඩ තහනම් කර ඇති වැඩ පරීක්ෂක ජේ.ජී.පී.පි. වීරසිංහ මහතා සම්බන්ධයෙන් විනය පරීක්ෂණ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක වන බැවින් එම පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් ණය ශේෂ අයකර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකිව ඇත.
	8. සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තා නියමිත දිනට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වුවද 2018 වර්ෂයේදී නියමිත දිනට කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව - 231	1. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2017 වර්ෂයේ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබූ අතර 2018 වර්ෂයේ සිට එය නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
	2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2014.02.17 දිනැති අංක 01/2014 චක්‍රලේඛයට අනුකූලව 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
	3. විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 03ක් වත් පවත්වා නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව මඟින් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නොපවත්වන අතර අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ සියළු විගණන හා කළමණාකරණ රැස්වීම් වලට සහභාගි වී ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමණාකරණ පද්ධතිය මඟින් ඇගයීම 2017 මුදල් වර්ෂය.</u>

	4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2018 වර්ෂය සහා භාණ්ඩ සමීක්ෂණය සිදු කර ඇති අතර ඊට අදාල නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.
	5. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුනි.	ඉදිරියේ දී සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ද වාහන වල ලොග් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලෙස ද අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි.
	6. අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකරගෙන තිබුණි.	ඉදිරියේ දී එවැනි අවස්ථාවක් ඇති නොවීමට කටයුතු කරනු ලැබේ.

සකස් කලේ :

එම්.එච්.කේ.ප්‍රනාන්දු

රාජ්‍ය කළමණාකරණ සහකාර

පරීක්ෂා කලේ:

ජී.එච්.ඒ.ජීවන්ති

ගණකාධිකාරී (අධිකරණ පරිපාලන)
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය